**ශීර්ෂය 281 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

**-------------------------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙන් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබදව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්ථාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**--------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහ ගණන් දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින්වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ අවශ්‍යතාවක් නොතිබුණු බැවින් ඉදිරිපත් කර තිබුණු සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ අවශ්‍යතාවක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **වාර්ෂික මූල්‍ය ප්‍රකාශන** | | |
| | 2018නොවැම්බර්21 දිනැති අංක 267/2018 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්,එය මාස 01 ක ප්‍රමාදයකින් පසු 2019අප්‍රේල් 02 දිනවිගණනයට ඉදිරිපත් කර තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ඉදිරිපත් කර නැත. |
| (ආ) | **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව වූ සැසඳුම් ප්‍රකාශනය** | | |
| | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරවවිෂය අංක 28101 රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම 2019 පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, එය මාස 03 ක ප්‍රමාදයකින් පසුව 2019 මැයි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | 2018නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සැසඳුම් ප්‍රකාශයප්රකාරව කටයුතු කළ යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නැත. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව සතු ගොවිජන සේවා මධ්‍යස්ථාන 553 ක, යාන්ත්‍රික අංගන 05ක , දෙපාර්තමේන්තුවට අදාළ දිස්ත්‍රික් කාර්යාල 25 ක හා ප්‍රධාන කාර්යාලයේ ඉඩම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනයට ගෙනනොතිබුණි. එමෙන්ම ගොවිජන සේවා මධ්‍යස්ථාන 35 ක ඉඩම් 2013 වර්ෂයේදී තක්සේරු කර තිබුණද එම වටිනාකම් මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි. | 2018 දෙසැම්බර් 21 දිනැති අංක 267/2018 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් නොවූ සියළුම වත්කම්වල තක්සේරු වටිනාකම් 2019වසරේදී CIGAS වැඩසටහනට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව දන්වා සිටිමි. |
| (ආ) | දෙපාර්තමේන්තුව සතු ගොවිජන සේවා | 2018 දෙසැම්බර් 21 | දෙපාර්තමේන්තුව සතු |

| | | | |
|---|---|---|---|
| | මධ්‍යස්ථාන 553 ක, යාන්ත්‍රික අංගන 05 ක, ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි 03 ක හා පුත්තලම දිස්ත්‍රික් කාර්යාලයේ පොහොර ගබඩාවේ ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනයට ගෙනනොතිබුණි. | දිනැති අංක 267/2018 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | දිස්ත්‍රික් කාර්යාල 25යටතේ ඇති ගොවිජන සේවා මධ්‍යස්ථාන 553 අතුරින් ගොවිජන සේවා මධ්‍යස්ථාන152 කට අදාළ ගොඩනැගිලි වටිනාකම් 2019 වර්ෂයේදී CIGAS වැඩසටහනට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව දන්වා සිටිමි. තවද ඉතිරි ගොඩනැගිලි සියල්ල මත තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර මේ වන තෙක් තක්සේරු වටිනාකම් ලැබී නොමැත. |
| (ඇ) | රත්නපුර සහ කිලිනොච්චි දිස්ත්‍රික් කාර්යාලවල ගොඩනැගිලි හා ඉදිකිරීම්වල නොනිමි වැඩ වටිනාකම වූ රු. 10,960,648 ක් වර්ෂය තුළ මිලදීගැනීම් ලෙස සටහන්කිරීම නිසා මූල්‍ය වත්කම් අත්පත් කරගැනීමේ වටිනාකම වැඩියෙන්ද නොනිමි වැඩ වටිනාකම එම ප්‍රමාණයෙන් දක්වා නොතිබුණි. | 2018 දෙසැම්බර් 21 දිනැති අංක 267/2018 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | රත්නපුර දිස්ත්‍රික් කාර්යාලයේ රු. 7,008,726 ක ගොඩනැගිලි හා ඉදිකිරීම් වටිනාකම 2018වර්ෂය තුළ සිදු කළ අවසන් ගෙවීමක් වන බැවින් එම වටිනාකම වර්ෂය තුළ ගොඩනැගිලි හා ඉදිකිරීම් මිලදී ගැනීම් අත්පත් කර ගැනීමයටතේ ප්‍රාග්ධනිත කර ඇත. තවද රු. 3,951,922 ක කිලිනොච්චි දිස්ත්‍රික් කාර්යාලයේ නොනිමි ගොඩනැගිලි හා ඉදිකිරීම් වටිනාකම නොනිමි වැඩ යටතේ වත්කම් ලේඛනය යටතේ ඉදිරිපත් කර ඇති බව දන්වා සිටිමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදීරු. මිලියන 7.9 ක් වටිනා වාහන 04 ක් වෙන්දේසි කර තිබුණත්, එම වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කර නොතිබුණි. | 2018 දෙසැම්බර් 21 දිනැති අංක 267/2018 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | එම වාහන 4හි වටිනාකම 2019 ජනවාරි මසයේ සාරාංශයෙන් CIGAS මඟින් ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කරන ලදී . |

**1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණකාධිකාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් ලෙස රු. 10,061,312,829 ක් දක්වා තිබුණත්, භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම තැන්පත් ලැබීම් හා වෙනත් ලැබීම් එකතුව රු. 10,780,245,891 ක් වී තිබුණි. ඒ අනුව රු. 718,933,062 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2018 දෙසැම්බර් 21 දිනැති අංක 267/2018 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ආ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්, සහනාධාර හා මාරුකිරීම්, භෞතික වත්කම් මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම නිසා රු. 10,160,120,306 ක් යටතේ දක්වා තිබුණත්, විගණනයට ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව එය රු. 10,130,218,625 ක් වී තිබුණි. ඒ අනුව රු. 29,901,681 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2018 දෙසැම්බර් 21 දිනැති අංක 267/2018 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ඇ) | ආයෝජන ක්‍රියකාරකම් සම්බන්ධ වූ වියදම් ප්‍රකාශයේ දැක්විය යුතු අත්තිකාරම් ලැබීම් රු. 279,526,261 ක් හා අත්තිකාරම් ගෙවීම් රු. 326,341,393 ක් දක්වා නොතිබුණි. | 2018 දෙසැම්බර් 21 දිනැති අංක 267/2018 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ඈ) | දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ක්‍රියාකාරකම්වල යෙදී නොතිබුණත්, මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ වූ ශුද්ධ මුදල් ප්‍රවාහය තැන්පත් ගිණුමේ හා රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ගෙවීම් ලෙස රු. 905,304,674 ක් දක්වා තිබුණි. | 2018 දෙසැම්බර් 21 දිනැති අංක 267/2018 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ඉ) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑ ලෙස රු. 400,395 ක් ලෙස දක්වා තිබුණත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අවසාන මුදල් ශේෂයක් නොමැති බව ප්‍රකාශ කර තිබුණි. | 2018 දෙසැම්බර් 21 දිනැති අංක 267/2018 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

**1.6.4 විගණන සාක්ෂි නොවීම**

---------------------------

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| **නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 272(2) ප්‍රකාරව කටයුතු නිම නොකළ 2018 වර්ෂයේරු 13,085,959 ක් වටිනා ගෙවීම් වවුචර් 110 ක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | අස්ථානගත වී තිබුණු වවුචර් මුදල් රෙගුලාසි 272(1) හා 1993 ජුලි 21 දිනැති අංක 320 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලැබී නැත. |

**1.6.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

---------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුවගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| | **නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරිම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආයතනයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරිමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.2 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නැත. |
| (ආ) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.5ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දි නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | - |

### 1.6.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | **නීති,රීතිහා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | **ව්‍යවස්ථාපිත විධිවිධාන** | | | |
| | 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 31 වගන්තිය | කණුමත නිවසක් ඉදිකිරීමට ලබාදුන් බලපත්‍රය වෙනුවට පර්චස් 10 කට වැඩි ප්‍රමාණයක කඩකාමර 03 ක් ඉදිකිරීමත් පහළ කොටස ගොඩකර වාහන ගාල් කිරීමත් සිදුකර තිබුණද, ඒ පිළිබඳ පරීක්ෂා කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන පනත අනුව කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නැත. |
| | (i) මුදල් රෙගුලාසි 1647 | වාහනභාර නිලධාරීන් විසින් වාහනවල විස්තර ඇතුළත් කරමින් මෝටර් වාහන ලැයිස්තුව පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නැත. |
| (ආ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| | 2009 අප්‍රේල් 16 දිනැති අංක 2009/9 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | දෙපාර්තමේන්තුවට අයත් ගොවිජන සේවා මධ්‍යස්ථාන 561 ක හා ගොවි බැංකු 535 ක සේවයේ නිරත නිලධාරීන් සහ සේවකයින්ගේ සේවයට පැමිණීම හා පිටවීම සටහන් කිරීමට ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූලධන වැය විෂයයන් 10 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 17 සිට සියයට 85 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් විතිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මහා භාණ්ඩාගාරය විසින් මුදල් නිකුත් කිරීම සිදු කරන්නේ වැය විෂයන් මත නොව ප්‍රාග්ධන, පුනරාවර්තන, වැටුප් සහ අත්තිකාරම් බී ගිණුම යන ශීර්ෂ යටතේය. එබැවින්, ඉහත අවශ්‍යතාව සපිරෙන පරිදි දෙපාර්තමේන්තුව විසින් අක්මුදල් ඉල්ලුම් කර ඇති බව දන්වා සිටිමි. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලයට අයත් ගොවිජන සේවා මධ්‍යස්ථාන 18 කින් ලබාගෙන තිබූ එකතුව රු. 7,995,849 ක මුදලක් වර්ෂයේ බැරකම්වලට ඇතුළත් කර නොතිබුණි. | බැදීම් හා බැරකම් නිසි පරිදි ගිණුම්ගත කළ යුතුය. | මධ්‍යස්ථානවලට ගෙවිය යුතු මුදල්වලින් බොහොමයක් නිරවුල් කිරීමට කටයුතු කර ඇති අතර, තවදුරටත් ගෙවිය යුතු මුදල් පිළිබඳ විස්තරාත්මක පිළිතුරක් ලබා දීම සඳහා යම් කාලයක් ගත වන බැවින්, ඒ සඳහා දින 14 ක කාල සීමාවක් ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 සහ 2018වර්ෂවල පිළිවෙළින් කළුතර සහ මාතර දිස්ත්‍රික් කාර්යාලවලට කාබනික පොහොර නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සඳහා සාරලංකා ණය යෝජනා ක්‍රමය යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලබාදුන් එකතුව රු. 400,000 ක ප්‍රතිපාදනඅදාළ කාර්යය සඳහා යොදවා නොතිබුණි. | විශේෂ ව්‍යාපෘති සඳහා ලැබෙන මුදල් අදාළ මුදල් වර්ෂයේදී යෙදවීමට කටයුතු කළ යුතු වීම. | මෙම මුදල් 2019 වර්ෂයේදී ගොවීන් වෙත ලබා දී ඇත. |
| (ආ) | කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථාන03 ක් මගින් ගොවීන් තිදෙනෙකුට ලබාදුන් එකතුව රු. 900,000 ක් වූ ණය මුදල් එම කාර්යයට යොදවා නොතිබුණි. | විශේෂ ව්‍යාපෘති සඳහා ලැබෙන මුදල් යෙදවීම පිළිබඳ වගකිව යුතු නිලධාරීන්විසින් අධීක්ෂණය කළ යුතුය | ණය වාරික නියමිත පරිදි ගෙවනු ලබන අතර කෙටි කාලයකින් අදාළ ණයකරුට පියවීමට නොහැකි වී තිබුණි. |
| (ඇ) | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන හා ග්‍රාමීය ආර්ථික පිළිබඳ අමාත්‍යාංශයේ ජල ජීවීන් වගාව ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ ගම්මන්පිල වැව සංවර්ධනය සඳහා රු.3,673,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, කාර්යය අවසන් කර නොතිබියදී ප්‍රාදේශීය ඉංජිනේරුවිසින් එම ගෙවීම් සහතික කරතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2018.12.29 දින වන විට සම්පූර්ණ කර තිබූ අතර, 2018.12.31දින ප්‍රාදේශීය ඉංජිනේරු විසින් අදාළ වැඩ කොටස් සම්පූර්ණ කර ඇති බවට තහවුරු කර තිබුණු බවත්, 2018 වර්ෂය අවසානයේදී අදාළ ගෙවීම දිස්ත්‍රික් භාරසහකාර කොමසාරිස් විසින් අනුමත කර ඇත. මේ දක්වා කොන්ත්‍රාත්කරු විසින් කරන ලද වැඩ කොටස්වලට මුදල් ගෙවීම සඳහා ප්‍රතිපාදන ලැබී නොතිබුණි. |
| (ඈ) | කෘෂිකර්ම අමාත්‍යාංශයේ පානදුර බොජුන්හළ ඉදිකිරීම සඳහා 1,579,332 ක ඇස්තමේන්තුවක් පිළියෙළ කර 2018 දෙසැම්බර් කාර්යයනිම කර තිබුණි.2019 මැයි 24 දිනවන විටත්බොජුන්හළට පිවිසීමට තරප්පු පෙළක් ඉදිකරනොතිබීම නිසා එයභාවිතයට ගැනීමට නොහැකිව නිෂ්ක්‍රීයව පැවතුණි. | විශේෂ ව්‍යාපෘති සඳහා ලැබෙන මුදල් යෙදවීම පිළිබඳ වගකිව යුතු නිලධාරීන්ගේඅධීක්ෂණ ය යොමු කළ යුතුය. | පිළිතුරු දක්වා නැත. |

## 2.4 තත්ත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කිරීම් හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සංශෝධිත මුදල් රෙගුලාසි 371(6) ට අනුකූල නොවීම 2018 වර්ෂයේදී නිකුත් කළරු. 228,125 තත්කාර්යය අතුරු අග්‍රිම නිරවුල් නොකර 2019 වර්ෂයේදී පියවා තිබූ2018 වර්ෂයේදී නිලධාරීන් 04 දෙනෙකුට නිකුත් කළ රු. 180,000 ක තත්කාර්යය අතුරු අග්‍රිම 2019 පෙබරවාරි 14 දින වන විටත් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පිළිතුරු දක්වා නැත. |
| (ආ) | මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව ලබාගත් තත්කාර්යය අතුරු අග්‍රිමයන් කාර්යය නිම වී දින 10 ක් ඇතුළත නිරවුල් කළ යුතුව තිබුණත්, සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් 30 දෙනෙකුටඅවස්ථා 275 කට ලබා දී තිබුණු එකතුව රු. 5,601,944 ක තත්කාර්යය අතුරු අග්‍රිම දින 31 ක සිට දින 352 ක් දක්වා පරාසයක කාලයක් ප්‍රමාද කර නිරවුල් කර තිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පිළිතුරු දක්වා නැත. |
| (ඇ) | 2015 ජූලි 14දිනැති අංක 3/2015 රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී නිලධාරී 30 කට අවස්ථා 275 කදී ලබා දුන් රු.5,601,944 අතුරු අග්‍රිමය දින 31 සිට දින 352 ක කාලයක් දක්වා පියවීමට ප්‍රමාද වී තිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉන්ධන අත්තිකාරම් පියවීම පිළිබඳ විස්තර සටහන් කර තිබුණි. |

## 2.5 තැන්පත් ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2015 සහ 2018 වර්ෂවල ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් දෙපාර්තමේන්තුවට දෙනු ලැබූ පිළිවෙළින් රු. 184,432 ක් හා රු. 5,958,319 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත්අදාළ කාර්යයන් සඳහා භාවිතයට නොගෙන තැන්පත් ගිණුමේ | වෙනත් ආයතනවලින් විවිධ කාර්යයන් සඳහා ලැබෙන මුදල් අදාළ කාර්යය සඳහා යෙදවීමට කටයුතු | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | රඳවාගෙන තිබුණි. | කළ යුතු වීම. | |
| (ආ) | 2016 ජූලි 01 දින වග්ගල්මෝදර කරදිය පාලන ව්‍යාපෘතිය සඳහා ලැබුණු රු. 226,551 ක් භාවිතයට නොගෙන පොදු තැන්පත් ගිණුමේ වර්ෂ 02 කට වැඩි කාලයක් රඳවාගෙන තිබුණි. | වෙනත් ආයතනවලින් විවිධ කාර්යයන් සඳහා ලැබෙන මුදල් අදාළ කාර්යය සඳහා යෙදවීමට කටයුතු කළ යුතු වීම. | අක්මුදල් නොමැති වීම නිසා ගෙවීමට නොහැකි වී ඇත. ඉදිරියේදී ගෙවීමට කටයුතු කරමි. |
| (ඇ) | පොහොර අත්තිකාරම් පියවීම සඳහා දිස්ත්‍රික් කාර්යාල සහ ගොවිජන සේවා මධ්‍යස්ථානවලින් 2015වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ලද රු. 39,751,808 ක මුදලක් අදාල ආයතනය වෙත නොගෙවා පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | පොදු තැන්පතු ගිණුමේ ශේෂයන් හඳුනාගෙන අදාළ ආයතනවලට නිරවුල් කළ යුතුය. | 2016 වර්ෂයේ ලද මුදලින් රු.මි.12.2 ක් මේ වන විට කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ගෙවා ඇති අතර, ඉතිරි මුදල්ද ගෙවීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. |
| (ඈ) | කොන්ත්‍රාත් වෙනුවෙන් රැඳවුම් මුදල් එකතුව රු. 2,353,842 ක් වර්ෂ 02 සිට වර්ෂ 05 දක්වා කාලයක සිට පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි. | කොන්ත්‍රාත්තුවේ අඩුපාඩු තිබේදැයි සොයා බැලීමෙන් පසු අදාළ රැඳවුම් මුදල්ගෙවිය යුතුය. | කාර්මික නිලධාරීන්ගේ පරීක්ෂාවෙන් පසුව ලබාගන්නා නිර්දේශයන් අනුව ගෙවීම් කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. |
| (ඉ) | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව වර්ෂ 02 ඉක්ම වූ තැන්පතු සම්බන්ධයෙන් නිසි පරීක්ෂාවකින් පසු නියාදනය කළ යුතු වුවත් පොදු තැන්පත් ගිණුම් 05 ක 2018 දෙසැම්බර් 31 දිනට වසර 02 ක් ඉක්ම වූ රු. 44,319,691 ක තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශයේ ඇතුළත්ව තිබුණු මාස 06 ක කාලය ඉකුත් වූ රු. 4,158,109 ක වටිනාචෙක්පත් 229 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 369(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | චෙක්පත් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | කිලිනොච්චි දිස්ත්‍රික්කාර්යාලයේ බැංකුසැසඳුම්වලවර්ෂ 02 ට වැඩිශේෂය වූ රු. 63,775 ක්හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | බැංකු සැසඳුම්වල පවතින ශේෂ හඳුනාගත යුතුය. | කඩිනමින් නිරවුල් කිරීමට ලිඛිතව දැනුම් දුන් බව දන්වා සිටිමි. |

**2.7 රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**

**-------------------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරණ ජාතික අයවැය චක්‍රලේඛයප්‍රකාරව ස්ථාන මාරු වී පැමිණි හා ගිය නිලධාරීන්ගේ ණය ශේෂ මාස 03 ක් ඇතුළත නිරවුල් විය යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දිනටස්ථාන මාරු වී ගිය නිලධාරීන් 32 කගෙන් අයවිය යුතු ණය ශේෂය රු. 1,754,679 ක් විය. එසේම ස්ථානමාරු වී පැමිණි නිලධාරීන් 03 කගෙන්අයවිය යුතු ණය ශේෂයරු. 336,227 ක් විය. | 2004 ඔක්තෝබර් 11 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 118 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නැත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**3.1 කාර්යයන් ඉටු නොකිරීම**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | පලන්නොරුව අම්බලන්කණුව අමුණ ඉදි කිරීමසඳහා 2018 වර්ෂයේදී රු. 4,506,448 ක් ප්‍රතිපාදන නිදහස් කර තිබුණත් එම කාර්යය 2018 දෙසැම්බර් 31දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | ක්‍රියාත්මක සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතුය. | පිළිතුරු ලැබී නැත. |
| (ආ) | ගාල්ල සහ කළුතර දිස්ත්‍රික් කාර්යාලවල ගොවීන් විසින් කුඹුරු ඉඩමක් වෙනත් කාර්යයක් සඳහා යොදාගැනීම / කුඹුරු ඉඩමක් නොවන බවට සහතිකයක් ලබා ගැනීමට2014, 2015 සහ 2016 වර්ෂවල ලබාදුන්ඉල්ලුම්පත්‍රවලට 2018 දෙසැම්බර් 31 දින දක්වා අදාළ සහතික ලබා දී නොතිබුණි. | ඉල්ලුම්පත් වලට ප්‍රතිචාර ප්‍රමාදයකින් තොරව ලබාදිය යුතුය. | පිළිතුරු ලැබී නැත. |

## 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2016, 2017සහ 2018 වර්ෂවලට අදාළව එම පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2016 - කෘෂිකර්ම අමාත්‍යාංශ අනුමැතිය ලැබී ඇති අතර, කැබිනට් මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර ඇත.<br>2017 - කෘෂිකර්ම අමාත්‍යාංශ අනුමැතිය ලැබී ඇති අතර, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පරිවර්තන කටයුතු සිදුවෙමින් පවතී.<br>2018 – 2019.05.23 දින කෘෂිකර්ම අමාත්‍යාංශ අනුමැතියට යවා ඇත. |

## 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මිහින්තලයේ යාන්ත්‍රික අංගනයේ පැවති ජල බව්සරය, බුල් ඩෝසර් හා වීල්ලෝඩර් 01 ක් වර්ෂ 1 ½ ක සිට ඵලදායීව උපයෝජනය කර ගැනීමට කටයුතු කරනොතිබුණි. | වත්කම් නිසි පරිදි කළමනාකරණය කළ යුතුය. | අදාළ යන්ත්‍ර කුලියට දෙනු ලබන්නේ ගොවි සංවිධාන මඟින් ඉල්ලුම් කළහොත් පමණක් වන අතර, මිහින්තලය යාන්ත්‍රික ඒකකයේ අදාළ යන්ත්‍ර ක්‍රියාකරුවන් රජයේ ස්ථිර සේවකයන් වන බැවින්, යන්ත්‍ර ක්‍රියාවේ නොයෙදුනද ඔවුනට වැටුප් ගෙවිය යුතු බව දන්වා සිටිමි. |

## 3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප ආඥා පනතේ 612 වැනි අධිකාරිය | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2018 වර්ෂය දක්වාම සේවක ඇප තැන්පතු |

| | | | |
|---|---|---|---|
| | අනුව ඇප තැබිය යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 9,540 ක් ඇප තබා නොතිබුණි. | | ලේඛනයක් පවත්වාගෙන ගොස් නොමැති අතර, මේ වන විට ඇප තැන්පතු ලේඛනයක් සකස් කිරීමේ මූලික කටයුතු ආරම්භ කර ඇති බව දන්වා සිටිමි. |
| (ආ) | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2018 වර්ෂය දක්වාම සේවක ඇප තැන්පතු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොමැති අතර, මේ වන විට ඇප තැන්පතු ලේඛනයක් සකස් කිරීමේ මූලික කටයුතු ආරම්භ කර ඇති බව දන්වා සිටිමි. |

**3.5 විගණන විමසුම් වලට පිළිතුරු ලබා නොදීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවවෙත සමාලෝචිත වර්ෂයේදී විසින් කරන ලද විගණන විමසුම් 22 කට සහ ඉකුත් වර්ෂ 03 කදී නිකුත් කළ විගණන විමසුම් 13 කට 2019මැයි 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු 137,585,737ක් වී තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | - |

**3.6 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල ගොවිජන සේවා මධ්‍යස්ථානයට අනුයුක්තව සිටි කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරයෙකු 2017 පෙබරවාරි15 දින සිට බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය පත්වීමක් ලබා ඒ බව සහකාර කොමසාරිස් දැනුවත් කර සේවයෙන් ඉවත් වී තිබුණි. එදින සිට 2018 ඔක්තෝබර් 31 දින දක්වා වැටුප් හා දීමනා ලෙස රු. 629,051 ක් ගෙවා | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. | | |
| (ආ) | කළුතර දිස්ත්‍රික්කයේ බදුරලිය ගොවිජන සේවා මධ්‍යස්ථානයට අනුයුක්තව සිටි කෘෂිකර්ම පර්යේෂන හා නිෂ්පාදන සහකාරවරයෙකු 2017 සැප්තැම්බර් 28 දින සිට වර්ෂ 02 ක කාලයකට වැටුප් රහිත නිවාඩු මත මුදාහැර තිබුණද ඔහු වෙත වැටුප් හා දීමනා ලෙස රු. 321,728 ක් ගෙවා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මෙම සේවකයා ඉවත් කර නැත. තාවකාලික මුදාහැරීමකි. ඔහුගෙන් අයකර ගැනීමට අවශ්‍ය මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | ගොවීන්ගේ භාරකාර අරමුදලෙන් 1999 වර්ෂයේදී ලබාගෙන තිබූ චක්‍රීය අරමුදල් ණය, 2003 වර්ෂයේදී ලබාගෙන තිබූ විශේෂ බඩඉරිඟු ණය මුදල්වලින් පිළිවෙළින් රු. 13,447,002 ක් සහ රු. 4,204,610 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ණය මුදල් කඩිනමින් අය කරගෙන ගොවීන්ගේ භාරකාර අරමුදලට පියවීමට කටයුතු කළ යුතුය. | මෙම ණය කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 1999 දී ලබා දී ඇති අතර අප දෙපාර්තමේන්තුව වෙත එම ණය මුදල් පවරා ඇත. අවශ්‍ය පරිදි ණය අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ඈ) | 2015 අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලයේ ගොවීන් 5,386 දෙනෙකුට රු. 80,790,000 කණය මුදල ලබාදී තිබුණද, 2018 දෙසැම්බර් 31 දින වන විටත් එයින් රු. 31,077,416 ක් අය කරගෙන නොතිබුණි. | අදාළ ණය මුදල් කඩිනමින් අය කරගෙන ගොවීන්ගේ භාරකාර අරමුදලට පියවීමට කටයුතු කළ යුතුය. | ණය මුදල් අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ඉ) | 1998 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කෘෂි ණය වෙනුවෙන් ලබා දී තිබූ රු. 7,635,172,221 ක් ලබා දුන් දින සිට මාස 06 කින් අය කරගත යුතුව තිබුණත් රු. 1,070,058,452 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අය කරගෙන නොතිබුණි. | අදාළ මුදල් අය කරගැනීමට ගොවිජන සේවා මධ්‍යස්ථාන ක්‍රියාමාර්ග ගත යුතුය. | ණය මුදල් අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ඊ) | 2001 වර්ෂයේදී දිස්ත්‍රික් කාර්යාල 05 කට ලබා දී තිබූ රු. 19,131,790 ක ගොවි සමාගම් ණය මුදල මාස 06 කින් අය කරගත යුතු වුවද එයින් රු. 13,855,243 ක් වර්ෂ 18 ක් ගත වී තිබුණද 2019 මැයි 31 දින වන විටත් අය කරගෙන නොතිබුණි. එම දිස්ත්‍රික් කාර්යාලවලින් නුවරඑළිය දිස්ත්‍රික්කයට ලබා දී තිබුණු රු. 10,600,000 ක මුදලින් සියයට 91 ක් පියවා නොතිබුණි. | අදාළ මුදල් අය කරගැනීමට ගොවිජන සේවා මධ්‍යස්ථාන ක්‍රියාමාර්ග ගත යුතුය. | පිළිතුරු දිස්ත්‍රික් කාර්යාලවලින් කැඳවා ඇත. |